# බුලත්සිංහල ප්‍රාදේශීය සභාව

## සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම - 2024 වර්ෂය

2024 වර්ෂය වෙනුවෙන් පහත සඳහන් භාණ්ඩ, වැඩ හා සේවා සැපයීමට කැමැත්තක් දක්වන කොන්ත්‍රාත්කරුවන්ගෙන්/ සැපයුම්කරුවන්ගෙන් / නිෂ්පාදකයන්ගෙන් 2023.11.30 දින දක්වා මා විසින් සැපයුම් හා සේවා ලියාපදිංචි කිරීමේ අයදුම්පත් කැඳවනු ලැබේ.

මේ සමග ඇති අයදුම්පත සම්පූර්ණ කර ලියාපදිංචි තැපැල මගින් ලේකම්, ප්‍රාදේශීය සභාව, බුලත්සිංහල යන නමට හෝ bulathsinghalaps@yahoo.com / bulathsinghala.prasaba@gmail.com යන ඊමේල් ලිපිනයන්ට එවිය යුතු අතර, තැපැලෙන් එවීමේදී කවරයේ වම් ඉහළ කෙළවර **"සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම 2024"** ලෙස සඳහන් කළ යුතුය. අදාල ගාස්තු **ලේකම්, ප්‍රාදේශීය සභාව, බුලත්සිංහල** යන නමට චෙක්පතකින් හෝ මුදල් ඇණවුමක් මගින් හෝ කාර්යාලයේ ගෙවීම් කවුන්ටරය වෙත ගෙවීම් කළ හැකිය.

සියළුම සැපයුම් බුලත්සිංහල ප්‍රාදේශීය සභාවට සපයා දිය යුතු අතර, දින 30ක කාලසීමාවක් සඳහා ණය පහසුකම් මත භාණ්ඩ හා සේවා සැපයීම සිදු කළ යුතු වේ. 2024 වර්ෂය සඳහා ලියාපදිංචි වන සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවීම සිදු කරනු ලබන අතර, එම මිළ ගණන් අවම මාස 06 ක කාලයක් සඳහාවත් අදාල විය යුතුය. වාහන අලුත්වැඩියාවන් සිදු කරනු ලබන ආයතන බස්නාහිර පළාත් සභාවේ අනුමත මෝටර් ගරාජයක් වීම විශේෂ සුදුසුකමකි.

සියළුම කොන්ත්‍රාත්කරුවන් සැපයුම්කරුවන් අදාල කාර්ය සඳහා ඉදිරියෙන් සඳහන් කර ඇති වටිනාකමට ලියාපදිංචි ගාස්තුව ගෙවීම සිදු කළ යුතු අතර, ඉල්ලනු ලබන කොන්ත්‍රාත්තුවේ වටිනාකමට සමාන වටිනාකම් සහතිකයක් ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය සමග ඉදිරිපත් කළ යුතුය. සාර්ථක කොන්ත්‍රාත්කරුවෙකු බවට සනාථ කිරීම සඳහා ඔබගේ ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතු අතර සීඩා (CIDA) ආයතනයේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් මේ සඳහා ඉල්ලුම් කළ යුතුය.

| | සැපයීම | ලියාපදිංචි වීමේ ගාස්තුව (රු: ශත) |
|---|---|---|
| 1. | සියළුම වර්ගයේ ලිපිද්‍රව්‍ය | රු: 1000.00 |
| 2. | සනීපාරක්ෂක උපකරණ (හිස් ආවරණ, මුඛ ආවරණ, ඕවරෝල්, ගම්බූට්ස්, ග්ලවුස්, සබන්, සේදුම් දියර ආදිය) හා විෂබීජ නාශක ද්‍රව්‍ය | රු: 1000.00 |
| 3. | කාර්යාල උපකරණ (ටෝනර්, ප්‍රින්ටර් රිබන්, කාට්රේජ්, ඩුප්ලෝ ඉන්ක්) | රු: 1000.00 |
| 4. | රෝනියෝ යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, මුද්‍රණ යන්ත්‍ර සැපයීම හා අමතර කොටස් සැපයීම | රු: 1000.00 |
| 5. | කාර්යාලීය ලී බඩු උපකරණ (යකඩ, වානේ, දැව, ප්ලාස්ටික්) | රු: 1000.00 |
| 6. | ඡායා පිටපත් යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍රය, ඩුප්ලෝ යන්ත්‍රය, අන්තර්ජාල, CCTV , අභ්‍යන්තර දුරකතන පද්ධති, ඇඟිලි සලකුණු යන්ත්‍ර අලුත්වැඩියාව | රු: 1000.00 |
| 7. | කළුගල්, ගඩොල්, වැලි ආදී ගොඩනැගිලි ද්‍රව්‍ය | රු: 1000.00 |
| 8. | හියුම් පයිප්ප හා සිමෙන්ති නිෂ්පාදන | රු: 1000.00 |
| 9. | තාර හා කෝලාස් | රු: 1000.00 |
| 10 | වාහන අමතර කොටස්, ටයර්, ටියුබ්, බැටරි, සීට් කුෂන්, කාපට් ආදිය | රු: 1000.00 |
| 11 | නාම පුවරු, දැන්වීම් පුවරු සහ බැනර් ඇඳීම හා සැකසීම | රු: 1000.00 |
| 12 | මුද්‍රණ කටයුතු (ලිපි ද්‍රව්‍ය) | |
| 13 | වීථි පහන් කට්ටල හා අමතර කොටස් ඇතුළු විදුලි උපකරණ, බල්බ් වර්ග | රු: 1000.00 |
| 14 | නිල ඇඳුම් රෙදි, වෙනත් රෙදි, වැහි කබා, පාවහන් | රු: 1000.00 |
| 15 | කම්කරු ආවුද හා උපකරණ (උදළු, රේක්ක, විල්බැරෝ හා වෙනත්) | රු: 1000.00 |
| 16 | ජලනල හා සම්පාදන උපාංග | රු: 1000.00 |
| 17 | ගොඩනැගිලි ද්‍රව්‍ය හා උපාංග (සිමෙන්ති, තීන්ත, වානේ, යකඩ උපකරණ, විදුලි උපකරණ) | රු: 1000.00 |
| 18 | වාහන අලුත්වැඩියා කිරීම | රු: 1000.00 |
| 19 | කුලියට වාහන සැපයීම (ත්‍රීවීල්, වෑන් රථ, ට්‍රැක්ටර්, ලොරි, කැන්ටර්, ටිපර්, බැකෝ ලෝඩර්, බුල් ඩෝසර් හා වෙනත් යන්ත්‍ර | රු: 1000.00 |
| 20 | ටයර් නැවත පිරවීම | රු: 1000.00 |
| 21 | ඉඩම් මැනුම් කටයුතු | රු: 1000.00 |
| 22 | සැරසිලි සඳහා අවශ්‍ය සැපයීම, තොරණ ඉදිකිරීම් ද්‍රව්‍ය, ශබ්ද විකාශන, විදුලිය, සැරසිලි හා වේදිකා සැපයීම | රු: 1000.00 |

| | | |
|---|---|---|
| 23 | බැකෝ, මාර්ග තලන යන්ත්‍ර අලුත්වැඩියාව | රු: 1000.00 |
| 24 | සියළු උපදේශක සේවා | රු: 1000.00 |
| 25 | සැලසුම් සේවා (ඉදිකිරීම් හා නිර්මාණ) | රු: 1000.00 |
| 26 | ඉංජිනේරු සේවා හා තාක්ෂණික සේවා සැපයීම | රු: 1000.00 |
| 27 | පුස්තකාල පොත් සැපයීම | රු: 1000.00 |
| 28 | පුහුණු නුපුහුණු ශ්‍රමිකයින් සැපයීම (වඩු කාර්මික, පෙදරේරු, වෙල්ඩින්, ජලනල කාර්මික) | රු: 1000.00 |
| 29 | පෙර පාසල් උපකරණ (ක්‍රීඩා භාණ්ඩ ඇතුළුව උද්‍යාන උපකරණ) | රු: 1000.00 |
| 30 | යන්ත්‍ර සූත්‍ර හා උපකරණ කුලියට සපයා ගැනීම | රු: 1000.00 |
| 31 | ගොඩනැගිලි වායු සමීකරණ යන්ත්‍ර සැපයීම, අළුත්වැඩියාව හා සැපයීම | රු: 1000.00 |
| 32 | ඉන්ධන හා ලිහිසි තෙල් සැපයීම | රු: 1000.00 |
| 33 | කාර්යාලයීය විදුලි උපකරණ හා උපාංග සැපයීම | රු: 1000.00 |
| 34 | තණකොළ කපන යන්ත්‍ර, වතුර මෝටර්, ජෙනරේටර්, විෂබීජ නාශක විදින යන්ත්‍ර ඇතුළු යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා | රු: 1000.00 |
| 35 | අබලි ද්‍රව්‍ය අලෙවිය සඳහා ගැණුම්කරුවන් (පැරණි පුවත්පත්, යකඩ, පොලිතින්) | රු: 1000.00 |
| 36 | වැලි ගොඩදැමීම සඳහා කුලී පදනම මත කම්කරුවන් සැපයීම | රු: 1000.00 |
| 37 | ආදාහනාගාර සේවා කිරීම (NERD ආයතනයේ ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කළ යුතුය) | රු: 1000.00 |
| 38 | ඔරලෝසු කණුව සේවා කිරීම | රු: 1000.00 |
| 39 | නීතිඥ හා නොතාරිස් සේවා | රු: 1000.00 |

කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

| අනු අංකය | ගාස්තු සීමා | ලියාපදිංචි වීමේ ගාස්තුව (රු: ශත) |
|---|---|---|
| 1. | රු: 100000.00 | රු: 1000.00 |
| 2. | රු: 100000.00 සිට 250000.00 දක්වා | රු: 1500.00 |
| 3. | රු: 250000.00 සිට 500000.00 දක්වා | රු: 2000.00 |
| 4. | රු: 500000.00 සිට 1000000.00 දක්වා | රු: 2500.00 |
| 5. | රු: 1,000,000.00 වැඩි | රු: 3000.00 |

**කොන්ත්‍රාත්කරුවන් සඳහා කොන්දේසි**

1. සීඩා (CIDA) ආයතනයේ සී 9 බාණ්ඩය යටතේ මාර්ග හා ගොඩනැගිලි විෂයට අදාලව ලියාපදිංචි වී තිබීම.
2. ආයතනයේ ලියාපදිංචි වලංගු සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළ යුතු වේ.
3. වැට් බදු සඳහා ලියාපදිංචි සහතිකයේ පිටපතක් සහ මෑතකදී ලබාගත් වැට් බදු නිරවුල් කිරීමේ සහතිකයේ පිටපතක් (ලියාපදිංචි නොමැතිනම් ලියාපදිංචි නොමැති බවට ප්‍රකාශයක්) අවශ්‍ය වේ.

**සැපයුම්කරුවන් සඳහා කොන්දේසි**

1. ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවනු ලබන අතර අවස්ථානුකූලව ඉන් බැහැරව භාණ්ඩ හා සේවා ලබාගැනීමේ අයිතිය සභාව සතුය.
2. මිල ගණන් විවෘත කිරීමේ අවස්ථාවට සහභාගී වීම සහ එහි නියමයන් පිළිගැනීම
3. සියළුම සැපයුම් සඳහා අවම වශයෙන් දින 30ක කාලසීමාවකට සභාව වෙත ණය පහසුකම් ලබාදිය යුතුය.
4. මිල ගණන් ඉදිරිපත් කිරීමේදී වලංගු කාලය අවම මාස 06 ක කාලයක් විය යුතුය.
5. මෙහි සඳහන් නොවන කොන්දේසි පැනවීමට සහ මිල ගණන් පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය සභාව සතුවන අතර බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ තීරණය අවසාන තීරණය වේ.

2024.10.12 දින බුලත්සිංහල ප්‍රාදේශීය සභා කාර්යාලයේදීය.
දුරකතන අංකය 034 22 83175

ලලනි දීපිකා උඩුමුල්ල,
ලේකම් හා බුලත්සිංහල ප්‍රාදේශිය සභාවේ බලතල
කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී ,
ප්‍රාදේශීය සභාව,
බුලත්සිංහල
සභාපති,